# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2009/3 – 2017 මාර්තු 06 වැනි සඳුදා – 2017.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරිය පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, පුංචිලෙවකන්ද ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/YTT/2016/257 හා 2016.07.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1012ක් පමණ වන මහලෙවකන්දවත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මහලෙවකන්ද වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1012ක් පමණ

උතුරට: මාර්ගය සහ හපුකොටුවේ ගෙදර ඩික්සන් හපුකොටුව හිමිකම් කියන මහලෙවකන්ද වත්ත; නැගෙනහිරට සහ දකුණට: හපුකොටුවේ ගෙදර ඩික්සන් හපුකොටුව හිමිකම් කියන මහලෙවකන්ද වත්ත; බටහිරට: හපුකොටුවේ ගෙදර ඩික්සන් හපුකොටුව හිමිකම් කියන මහලෙවකන්ද වත්ත සහ මාර්ගය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2013/ඩබ්ලිව්එස්/461.
2016 දෙසැම්බර් මස 04 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 938